# සංස්කෘතිය වෙනස්වීම හා රැකීම

ලෝකයේ විවිධ ජනවර්ග හා ජාතීන් තම සංස්කෘතීන් ආරක්ෂාකිරීම සඳහා වාරණය ඇතුළු විවිධ ක්‍රම භාවිතාකර ඇති අතර දැනුදු භාවිතා කරන බව පැහැදිලි ය. එහෙත් මෙහි දී කිවයුතු කරුණු දෙකක් වෙයි. පළමුවෙන් ම සංස්කෘතිය ආරක්ෂාකිරීම යනුවෙන් අදහස්කරන්නේ කුමක් ද යන්න තවත් පැහැදිලි කළ යුතු ය. දෙවනුව අද වාරණයට විරුද්ධව මෙතරම් හඬක් නගන්නේ ඇයි ද යන්න අවබෝධ කරගත යුතු ය. එහි දී එසේ හඬ නගන්නේ කවු ද යන්න ද සොයා බැලිය යුතු ය.

සංස්කෘතියක් ආරක්ෂාකිරීම යනු අදාළ සංස්කෘතිය නොවෙනස්ව පවත්වාගෙන යෑම නො වෙයි. විශ්වයේ කිසිවක් නොවෙනස්ව නොපවතින බව සිංහලයෝ විශේෂයෙන් ම සිංහල බෞද්ධයෝ දනිති. අනිත්‍ය ගැන නිතර දෙවේලේ මෙනෙහිකිරීමට උගන්වන දහමක් අනුගමනය කරන්නන්ට සංස්කෘතිය ද වෙනස්වන බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. එසේ නම් සංස්කෘතිය ආරක්ෂාකිරීම යන්නෙන් අදහස්කරන්නේ කුමක් ද? නිර්මල වූ සිංහල බෞද්ධ සංස්කෘතියක් හෝ වෙනත් සංස්කෘතියක් හෝ නො මැත. සංස්කෘතිය ද වෙනස්වන බව අපි අවධාරණය කරමු.

සිංහල සංස්කෘතිය හෝ වෙනත් සංස්කෘතියක් හෝ ආරක්ෂාකිරීම යනු ඒ නොවෙනස්ව රැකගැනීම නො වේ. ඒ කළ නොහැකි කාර්යයකි. එසේ වුවත් සංස්කෘතියක් වෙනස්වන ආකාර වෙයි. එහි දී සංස්කෘතියට හිමි අනන්‍යතාවක් රැකෙන පරිදි හෝ නොරැකෙන පරිදි හෝ සංස්කෘතිය වෙනස්විය හැකි ය. සංස්කෘතිය වෙනස්වීමේ දී අනන්‍යතාව නොරැකෙයි නම් එතැන ගැටළුවක් ඇත. දැන් ප්‍රශ්නය වනුයේ සංස්කෘතියක අනන්‍යතාව රැකෙන්නේ කෙසේ ද යන්න ය. සියල්ල වෙනස්වන්නේ නම් අනන්‍යතාව වෙනස්වීමේ ඇති වරද කුමක් දැයි කිසිවකුට ප්‍රශ්න කළ හැකි ය.

සංස්කෘතියක අනන්‍යතාව යන්න තීරණය වන්නේ අනෙක් සංස්කෘතීන්ට සාපේක්ෂව ය. අනෙකුත් සංස්කෘතීන් ද වෙනස් වෙයි. එසේ වෙනස්වන කල යම් සංස්කෘතියක් අනෙක් සංස්කෘතීන් අතර කිඳා බසින්නේ නම් එවිට අදාළ සංස්කෘතියෙහි අන්‍යතාව නැතිවෙයි. එසේ ම ඕනෑම සංස්කෘතියක් වෙනස්වන ස්වරූපය අනුව එසේත් නැත්නම් වෙනස්වීමේ ශීඝ්‍රතාව අනුව අනන්‍යතාව වෙනස්වන්නේ ද නැත් ද යන්න ගැන යුක්තියුක්ත කළහැකි තීරණයකට එළඹිය හැකි ය. සංස්කෘතීන් වෙනස් වී ඇති ආකාරය අධ්‍යයනය කිරීමෙන් අනෙක් සංස්කෘතීන්ට මෙන් ම ඒ සංස්කෘතියට ද සාපේක්ෂව යම් සංස්කෘතියක් අනන්‍යතාව රැකගන්නේ ද නැත් ද යන්න ගැන තීරණයකට එළඹිය හැකි ය.

මූලික වශයෙන් ගත්කල සංස්කෘතියක් තුන් ආකාරයකින් වෙනස් වෙයි. ඒ අභ්‍යන්තර ව වෙනස් විය හැකි ය. අදාළ සංස්කෘතියෙහි නිර්මාණයවන ඇතැම් දේ මගින් සංස්කෘතිය වෙනස්විය හැකි ය. විවිධ ජනවර්ග එකතු වී සිංහලයන් වීමට පෙර, මෙහි විසූ යම් ජනවර්ගයක් විසින් වැව් නිර්මාණය කරනු ලැබීමෙන් පසුව මෙරට සංස්කෘතියෙහි යම් වෙනස්කමක් සිදුවන්නට ඇත. වැව් නිර්මාණය පිටරටකින් මෙරටට ලැබුණක් නොවන බව වෙනත් රටවල ඔවුන් විසින් ම නිර්මාණය කර ඇති වැව් නොමැති වීමෙන් පැහැදිලි වෙයි.

දෙවනුව බාහිර සංස්කෘතියක ඇතැම් අංගයක් අවශෝෂණය කරගැනීමෙන් සංස්කෘතියක් වෙනස්විය හැකි ය. එක්තරා ආකාරයකින් ගතහොත් බුදුදහම මෙරට සංස්කෘතියට අවශෝෂණය කෙරී ඇත. එහෙත් එහි දී කිවයුතු විශේෂ කරුණ නම් බුදුදහම අවෛදික සංස්කෘතියක නිර්මාණය වීම හේතුවෙන් ඒ අප රටට මුළුමනින් ම ආගන්තුක නොවූ බව ය. බුදුදහම මෙරටට හඳුන්වාදීම හංසයා දියට දැමීමක් වැනි ක්‍රියාවක් විය. අවශෝෂණය බාහිර අයගේ මැදිහත්වීමෙන් හෝ නොවීමෙන් හෝ විය හැකි ය. අවශෝෂණයෙන් බාහිර සංස්කෘතියේ සංකල්පය යම්කිසි වෙනසකට භාජනය වී අදාළ සංස්කෘතියට ඇතුල් වෙයි.

පහළොස්වැනි සියවසට පෙර භාරතයේ, චීනයේ, ලංකාවේ හා වෙනත් රටවල තිබූ දැනුම යුරෝපීය රටවල, මුල දී දකුණු යුරෝපීය රටවල අවශෝෂණය කෙරිණි. උදාහරණයක් ලෙස ගතහොත් භාරතයේ ජීවමාන ගතික (dynamic) සංකල්පයක් ලෙස පැවති බිංදුව (ශූන්‍යය) යුරෝපීය සංස්කෘතීන් විසින් අවශෝෂණය කෙරුණේ අජීවී දරදඬු ස්ථිතික

© Prof. Nalin De Silva

සංකල්පයක් ලෙස ය. භාරතයේ ශූන්‍යය නිර්මාණය වූයේ අගයක් නැති එහෙත් යමක් ඇති සංකල්පයක් ලෙස ය. එය භාරතීය බෞද්ධයන් විසින් නිර්මාණය කෙරුණු සංකල්පයක් විය. මාධ්‍යමිකවාදයේ ශූන්‍යතාව බිංදුව නිර්මාණය කිරීමේ දී වැදගත් කාර්යයක් ඉටු කෙළේ ය. ඒ සංකල්පය චතුස්කෝටික න්‍යායෙහි උපත ලැබී ය.

එහෙත් ශූන්‍යය බටහිර අවශෝෂණය කරනු ලැබුයේ ඇරිස්ටෝටලීය ද්විකෝටික න්‍යාය සහිත සංස්කෘතියක ය. බටහිර රටවල බුද්ධිමතුන්ට ප්‍රශ්නය වූයේ කිසිම අගයක් නැත්නම් එයට යමක් අඩුතරමේ සංකේතයක් හා සංකල්පයක් තිබිය හැක්කේ කෙසේ ද යන්න ය. කිසිවක් නැත්නම් කිසිවක් කුමකට ද යන්න ඔවුන්ගේ ප්‍රශ්නය විය. අවසානයේ දී සියවසක පමණ සංවාදයකින් පසුව යුරෝපීය බුද්ධිමත්තු ශූන්‍යය තම සංස්කෘතියට අවශෝෂණය කළහ. එහෙත් එසේ කෙළේ ශූන්‍යයේ ජීවය මරා දමමින් එය ස්ථිතික සංකල්පයක් බවට පත්කරමිනි. කලනය භාරතයේ නිර්මාණය වී පසුව නිව්ටන් හා ලයිබ්නීට්ස් විද්වතුන් විසින් බටහිරට හඳුන්වාදෙන ලදී. කලනයේ ජීවය ඇත්තේ ම ශූන්‍යයට අගයක් තිබීම හා නොතිබීම හේතුවෙනි. එහෙත් නිව්ටන් විද්වතා විසින් ශූන්‍යයෙහි ජිවය නැති සංස්කෘතියකට කලනය අවශෝෂණය කිරීමට යැමෙන් අවකලනය යන සංකල්පය මහත් අර්බුදයකට ව්‍යාකූලත්වයකට පත්කරනු ලැබිණි.

බුදුදහම සිංහල සංස්කෘතියට අවශෝෂණය කිරීමේ දී බෝධි වන්දනාව එකතුකරගනු ලැබිණි. සිංහල බෞද්ධ සංස්කෘතිය යනු අශෝක බෞද්ධ සංස්කෘතියෙහි පිටපතක් නො වෙයි. මහායාන බෝධිසත්ව සංකල්පය සිංහල ථෙරවාද බෞද්ධ සංස්කෘතියට අවශෝෂණය කෙරුණේ මුල් සංකල්පයෙහි තිබූ අතිමානුෂික ගුණ බැහැරකිරීමෙනි. එමෙන් ම ථෙරවාදීන්ගේ බෝධිසත්වයෝ සසර ගමනෙහි කෙළවර බුදුවෙති. එතුමෝ මහායානයෙහි මෙන් අනෙක් සියළු දෙනා නිවන් දකින තුරු බලා නොසිටිති. ථෙරවාදයෙහි බෝධිසත්වයෝ බුදුරජාණන් වහන්සේට වන්දනාමාන කරන පෘථග්ජනයෙකි. මේ කරුණුවලින් පැහැදිළිවන්නේ එක් සංස්කෘතියක සංකල්පයක් තවත් සංස්කෘතියකට බාහිර මැදිහත්වීමක් ඇතිව හෝ නැතිව හෝ අවශෝෂණය කෙරෙන ආකාරය ය. අවශෝෂණයෙන් පසුව අදාළ සංස්කෘතියෙහි යම් වෙනසක් විය හැකි ය.

තුන්වැනුව සංස්කෘතියක් වෙනස් වන්නේ සංස්කෘතික යටත්විජිතවාදය විසින් අධිපතිවාදී සංස්කෘතියක ඇතැම් අංග වෙනත් සංස්කෘතියක් මත සෘජුව හෝ වකුව හෝ පැටවීමෙනි. අනුකරණය සිදුවන්නේ ද මෙහි අවස්ථාවක් ලෙස ය. මිනිසුන් අනුකරණය කිරීමට පෙළඹෙන්නේ තමන්ට වඩා ඊනියා ඉහළ සංස්කෘතියක ලක්ෂණ ය. ඉහළ සංස්කෘතියක් යනු සංස්කෘතික යටත්විජිතවාදය (අධිපතිවාදය) විසින් නිර්මාණය කෙරෙන සංකල්පයකි. බටහිර මානව විද්‍යාඥයකු වූ රෙඩ්ෆීල්ඩ් මහතා විසින් ඊනියා මහා සම්ප්‍රදාය (great tradition) හා චූල සම්ප්‍රදාය (little tradition) යන සංකල්ප නිර්මාණය කෙරුණේ සංස්කෘතික අධිපතිවාදය යන්න වසා දැමීමට ය. අද මෙරට සිරින ඊනියා උගත්තු රෙඩ්ෆීල්ඩ් විද්වතාගේ සංකල්පය අනුකරණය කළ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා අනුව යමින් මහා සම්ප්‍රදායක් හා චූල සම්ප්‍රදායක් ගැන කතාකරති. රෙඩ්ෆීල්ඩ් මහතාගේ ඒ හා සම්බන්ධ ලිපිය පවා කියවා නැති මොවුහු මේ සංකල්ප අනුකරණය කරන්නේ සමන්ගේ සංස්කෘතිය ඊනියා පහත් සංස්කෘතියක් යැයි උපකල්පනය කරමිනි. සංගීතයේ වේවා වෙනත් ක්ෂෙත්‍රයක වේවා භාරතීය මහා සම්ප්‍රදාය හෝ බටහිර මහා සම්ප්‍රදාය හෝ ගැන කියවන්නවුනට රෙඩ්ෆීල්ඩ් මහතා කියා ඇත්තේ කුමක් ද යන්න පිළිබඳව කිසිම අවබෝධයක් නැත.

අද මෙරට සමාජයේ විශාල පිරිසක් බටහිරයන් අනුකරණය කරන්නේ සංස්කෘතික යටත්විජිතවාදයට යටවෙමිනි. මොවුන්ගෙන් ඇතැමෙක් දේශපාලනයෙහි දී සමාජවාදීන් ලෙස පෙනී සිටිති. එහෙත් බටහිර සංස්කෘතික යටත්විජිතවාදයට හිස නමන මොවුන් අධිරාජ්‍ය විරෝධීන් හෝ යටත්විජිතවාදයට විරුද්ධවූවන් හෝ ලෙස පෙනී සිටින්නේ කෙසේ ද? යටත්විජිතවාදයෙහි භයානක ම සංරචකය සංස්කෘතික සංරචකය වෙයි. අනුකාරකයන් ලවා යම් රටක සංස්කෘතිය වෙනස්කරවීම වක්‍ර ක්‍රියාවකි. බ්‍රිතානියෝ අධ්‍යාපනය මගින් හා වරප්‍රසාද ලත් පිරිසක් බිහිකිරීමෙන් මුල දී තම සංස්කෘතිය බලයෙන් අප මත පැටවූහ. ඒ දේශපාලන ආධිපත්‍යය ඔස්සේ සිදුවූවකි. එහෙත් බටහිර අධ්‍යාපනයක් ලත් පිරිසක් හා වරප්‍රසාදිතයන් ඇතිකිරීමෙන් පසුව දේශපාලන ආධිපත්‍යය අවම මට්ටමක තිබිය දී ද ඔවුන් ලවා තම සංස්කෘතිය අනුකරණය කරවීමේ හැකියාව බටහිරයන් සතුවිය.

© Prof. Nalin De Silva

බටහිරයන් අප රටවලට නිදහස දුන්නේ සෘජුව ම දේශපාලන ආධිපත්‍යය පවත්වාගෙන යෑමේ හැකියාව ඊනියා දෙවැනි ලෝක යුද්ධයෙන් පසුව ඔවුන් අතින් ක්‍රමයෙන් ගිළිහී ගිය බැවිනි. එහෙත් ඔවුහු ආර්ථික යටත්විජිතවාදය හා සංස්කෘතික යටත්විජිතවාදය දිගින් දිගට ම ගෙන ගියහ. සුදු අධ්‍යාපන නිලධාරීන් විසින් සකස්කරන ලද පාඨමාලා හා පාසල් ව්‍යුහය අපි තවමත් පවත්වාගෙන යමු. තැනින් තැන සුළු වෙනස්කම් සිදු වී ඇති නමුත් හරයෙන් වෙනසක් සිදු වී නැත. ඒ හරය පවත්වාගෙන යනු ලබන්නේ බටහිර අච්චුව තුළ ම නිර්මාණය කෙරුණු නිලධාරීන් විසිනි. ඒ නිලධාරීන් දන්නා එකම දෙය අනුකරණය කිරීම ය.

අද මෙරට සංස්කෘතික යටත්විජිතවාදය ප්‍රධාන වශයෙන් ම පවත්වාගෙන යන්නේ රූපවාහිනී නාලිකා ඔස්සේ ය. මෙරට සංස්කෘතිය දියකරන වැඩසටහන් මේ නාලිකා මගින් ප්‍රචාරය කෙරෙයි. ඒ අතර ඔවුහු සියළු පව් වසාගැනීමට මෙන් ධර්මදේශනා ද ප්‍රචාරය කරති. මේ රූපවාහිනී නාලිකාවල අයිතිකරුවෝ ද ඊනියා වැඩසටහන් නිපදවන්නෝ ද සිංහල සංස්කෘතියට විරුද්ධව ක්‍රියාකරති. මෙයින් අදහස් කෙරෙන්නේ සිංහල සංස්කෘතියට විරුද්ධව කටයුතුකරන්නේ ඇතැම් රූපවාහිනී නාලිකා පමණක් නො වෙයි. ඇතැම් ගුවන් විදුලි නාලිකා ද විලි බිය නොමැතිව මේ කාර්යයෙහි නිරතවනු දක්නට ලැබෙයි. මෙහි දී ඊනියා වැඩසටහන් නිපදවන්නන් යැයි ඔවුන්ට කියන්නේ ඔවුන් නිපදවන වැඩසටහනක් නොමැති බැවිනි. ඔවුන් කරන්නේ අනුකරණයක් පමණකි. මේ ඇතැම් ඊනියා වැඩතටහනක් වාරණයකිරීමේ අවශ්‍යතාව පැන නගී. එසේ වාරණය නොකළහොත් සිංහල සංස්කෘතිය ආරක්ෂා කරගැනීම ඉතා දුෂ්කර වනු ඇත. එනම් සිංහල සංස්කෘතියේ අනන්‍යතාව රැකගැනීම අතිමහත් දුෂ්කර කාර්යයක් වනු ඇත. අද ගුවන්විදුලි නාලිකා ඔස්සේ කතාකරන්නේ ඉංගිරිසි වචන යොදමින් පමණක් නො වෙයි. ඒ කසිකබල් නිවේදකයෝ හා නිවේදිකාවෝ ඉංගිරිසි සම්ප්‍රදායෙන් සිංහල කතාකරති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva